ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

අප SPMC ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත්, ක්‍රියාශීලී, ස්වයං උද්යෝගී, වෘත්තීය උත්තමාකාමී, කණ්ඩායම් සාමාජිකයන් විය හැකි අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සෑම අයදුම්කරුවකුම :

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය

(ii) තනතුරේ රාජකාරි නිසියාකාරව ඉටු කිරීම සඳහාත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවන ලෙසත් මනා ශාරීරික හා මානසික තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iii) මනා චරිතයක් සතුවිය යුතුය.

(1) ඖෂධ තාක්ෂණවේදී (සැලසුම් හා ප්‍රසම්පාදන) තනතුර - JM-1-1- II ශ්‍රේණිය

බාහිර අයදුම්කරුවන්

සුදුසුකම්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යා ප්‍රථම උපාධිය

සහ

(ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එක් අවුරුදු සහතික පාඨමාලාව

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවකට / සංස්ථාවකට / මණ්ඩලයකට / ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ පිළිගත් වෙළඳ ආයතනයකට දේශීය / විදේශීය සැපයුම් කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

JM-1-1-2006 A - රුපියල් 20,525/- - 10x365-18x550-34,075/-

JM-1-1-2016 - රුපියල් 42,600/- - 10x755-18x1,135- 70,580/-

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරඟකාරී විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(2) ගබඩා පාලක තනතුර - (MA 2-1) III ශ්‍රේණිය - (තනතුරු 03)

බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපනික :

(i) අපොස (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව විෂයයන් ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

සහ

(ii) අපොස (උ/පෙළ) විභාගයෙන් (නව විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් 02 සමත්වීම.

හෝ

අපොස (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විද්‍යා ධාරාවේ විෂයයන් 02 ක් සමත්වීම.

සහ

(iii) පරිගණක සාක්ෂරතාවය

සහ

(ආ) රජයේ සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

සහ

(ඇ) වෘත්තීය :

NVQ සුදුසුකම් 5 තලයට නොඅඩු මිලදී ගැනීම් හෝ ගබඩා තොග කළමනාකරණ ඩිප්ලෝමාවක්.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

SPMC ආයතනයේ සේවයේ නියුතු ප්‍රාථමික තලයේ නුපුහුණු, අර්ධ පුහුණු හෝ පුහුණු වර්ගීකරණයෙන් යුත්, අපොස (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ, විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් හා වෘත්තීය සුදුසුකම් සහිතව, අදාළ පළපුරුද්ද ලබාගැනීමට පටන් ස්ථිර තනතුරක වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවය සතුවිය යුතුය.

වැටුප් පරිමාණය :

MA 2.1-2006-A : රුපියල් 14,610/- - 10x145-7x170-4x240-20x320-24,610/-

MA 2.1 - 2016 - රුපියල් 30,310/- - 10x300-7x350-4x495-20x660-50,940/-

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරඟකාරී විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(3) නවන්තු තාක්ෂණ ශිල්පී (යාන්ත්‍රික / විදුලිමය) (MA-2-1- III ශ්‍රේණිය) - (තනතුරු 03)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

(අ) වෘත්තීය :

(i) කාර්මික විද්‍යාල මඟින් පවත්වනු ලබන අදාළ ක්ෂේත්‍රයේ (NVQ - 5 තලයට සමාන) විදුලි යාන්ත්‍රික ඩිප්ලෝමා පාඨමාලාව

සහ

රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

හෝ

(ii) ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මඟින් පවත්වනු ලබන, අදාළ ක්ෂේත්‍රයේ වසර හතරක පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කොට තිබීම.

සහ

රජයේ සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

MA 2.1-2006-A : රුපියල් 14,610/- - 10x145-7x170-4x240-20x320-24,610/-

MA 2.1-2016:රුපියල් 30,310/- - 10x300-7x350-4x495-20x660-50,940/-

අභ්‍යන්තර අයදුම්කරුවන් :

SPMC ආයතනයේ සේවයේ නියුතු ප්‍රාථමික තලයේ නුපුහුණු, අර්ධ පුහුණු හෝ පුහුණු වර්ගීකරණයෙන් යුත්, අපොස (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ, ගණිතය හා ඉංග්‍රීසි හා වෙනත් ඕනෑම විෂයයක් ඇතුළත්ව සම්මාන හතරක් සහිතව විෂය හයකින් සමත් හා ඉහත (අ) හි සඳහන් වෘත්තීය සුදුසුකම් සමඟ අදාළ පළපුරුද්ද ලබා ගැනීමට පටන් ස්ථිර තනතුරක වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවය සතුවිය යුතුය.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරඟකාරී විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(4) තත්ව පාලන සහකාර තනතුර - (MA 2-1) III ශ්‍රේණිය - (තනතුරු 02)

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් :

(අ) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල / දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි හා ගණිතය යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

සහ

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (නව විෂය නිර්දේශය) රසායන විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන සාමාර්ථ 02 ක් සහිතව (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03 කින් සමත් වීම.

හෝ

අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) රසායන විද්‍යාව ඇතුළු විෂයයන් 02 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03 කින් සමත් වීම.

සහ

(iii) පරිගණක සාක්ෂරතාවය අතිරේක සුදුසුකමක් සේ සැලකීම

සහ

(iv) පිළිගත් ඖෂධ නිෂ්පාදන ආයතනයක වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.

(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - ඉහත (i) (ii) හා (iii) සමගාමීව අභ්‍යාසලාභීන් බඳවා ගැනීම.

තත්වපාලන සහකාර තනතුරේ ස්ථිර සේවා නියුක්තියට අන්තර් ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යාසලාභී තත්ව පාලන සහකාර තනතුරේ වසර 1 1/2 ක සේවාස්ථ පුහුණු කාල සීමාවක් (NVQ level 5 ට සමාන) සම්පූර්ණ කර තිබීම හා ලිඛිත පරීක්ෂණ වලින් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකේ.

(ඇ) වෘත්තීය

පුහුණුවන කාල සීමාව තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයේ විෂයන් හයකින් සමත් වෘත්තීය සුදුසුකම් ලබා ඇති හා අදාළ පළපුරුද්ද ලැබීමට පටන් ස්ථිර සේවයේ තනතුරක වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවාවක් සම්පූර්ණකර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු සේවා ශ්‍රේණියේ සේවකයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :

MA 2.1-2006-A : රුපියල් 14,610/- - 10x145-7x170-4x240-20x320-24,610/-

MA 2.1-2016 : රුපියල් 30,310/- - 10x300-7x350-4x495-20x660-50,940/-

වයස් සීමාව :

වයස අවු. 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය :

තරඟකාරී ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

(5) තාක්ෂණික සහකාර තනතුර - MA-2-1-III ශ්‍රේණිය - (තනතුරු 02)

බාහිර අයදුම්කරුවන් :

(අ) අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් :

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය, හා විද්‍යාව යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ 04 ක් සහිතව විෂයන් 06 කින් සමත්වීම.

සහ

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (නව විෂය නිර්දේශය) රසායන විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන සාමාර්ථ 02 ක් සහිතව (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03 කින් සමත් වීම

හෝ

අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශයට) රසායන විද්‍යාව ඇතුළු විෂයයන් 02 ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් 03 කින් සමත්වීම

සහ

(iii) පරිගණක සාක්ෂරතාවය අතිරේක සුදුසුකමක් සේ සැලකීම

සහ

(iv) පිළිගත් විද්‍යාගාරයක වසර තුනක (03) විශ්ලේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - ඉහත (I) (II) හා (III) සමගාමීව අභ්‍යාස ලාභීන් බඳවා ගැනීම.

තාක්ෂණික සහකාර - වර්ගීකරණ / පර්යේෂණ හා සංවර්ධන තනතුරේ ස්ථිර සේවා නියුක්තියට අන්තර් ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ අභ්‍යාසලාභී තාක්ෂණික සහකාර (වර්ගීකරණ / පර්යේෂණ හා සංවර්ධන) වසර 1 1/2 ක සේවාස්ථ පුහුණු කාලසීමාවක් (NVQ - Level 5 ට සමාන) සම්පූර්ණ කර තිබීම හා ලිඛිත පරීක්ෂණ වලින් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකේ.

(ඇ) පුහුණු කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

වැටුප් පරිමාණය :

MA 2.1-2006-A : රුපියල් 14,610/- - 10x145-7x170-4x240-20x320-24,610/-

MA 2.1-2016 : රුපියල් 30,310/- - 10x300-7x350-4x495-20x660-50,940/-

අභ්‍යන්තර ඉල්ලුම්කරුවන් :

දෙවතාවකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි / දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ හතරක් සහිතව (නවන්තු කාර්මික ශිල්පී තනතුර සඳහා විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් තිබීම අනිවාර්යය නොවේ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත් හා ඇමුණුම 02 හි දක්වෙන වෘත්තීය සුදුසුකම් ඇති හා අදාළ පළපුරුද්ද ලැබීමට පටන් ස්ථිර සේවයේ තනතුරක වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු සේවා ශ්‍රේණියේ සේවකයෙකු විය යුතුය.

වයස් සීමාව :

වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය :

තරඟකාරී ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.

(6) සැලසුම් හා ප්‍රසම්පාදන සහකාර තනතුර - (MA 2-1) III ශ්‍රේණිය - (තනතුරු 01)

(අ) අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් :

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක් වතාවකදී සිංහල/ දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළු විෂයන් සඳහා සම්මාන සාමාර්ථ 04 ක් සහිතව විෂයන් 06 කින් සමත් වීම.

හා

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (නව විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 02 කින් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සමත් වීම.

හෝ

අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 02 කින් සමත්වීම.

හා

(iii) පරිගණක සාක්ෂරතාවය තිබීම.

හා

(ආ වෘත්තීය සුදුසුකම් :

මිලදී ගැනීම් හා වාණිජ භාණ්ඩ කළමනාකරණය පිළිබඳ NVQ - 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

අභ්‍යන්තර ඉල්ලුම්කරුවන් :

දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයන් හයකින් සමත්වීම හා අදාළ පළපුරුද්ද ලැබීමට පටන් ස්ථිර සේවයේ තනතුරක වෘත්තීය සුදුසුකම් සහිතව 05 වසරක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු සේවා ශ්‍රේණියේ සේවකයෙකු විය යුතුය.

වැටුප් පරිමාව :

MA 2.1-2006-A:රුපියල් 14,610/- - 10x145-7x170-4x240-20x320-24,610/-

MA 2.1-2016 රුපියල් 30,310/- - 10x300-7x350-4x495-20x660-50,940/-

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය :

තරඟකාරී ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

පොදු කොන්දේසි :

- අභ්‍යන්තර ඉල්ලුම්කරුවන් හට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
- ඉහත දක්වා ඇති වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

ආකර්ෂණීය ප්‍රතිලාභ :

- පැමිණීමේ හා කාර්යසාධන දිරි දීමනා
- ප්‍රයෝජනයට නොගත් වාර්ෂික හා අසනීප නිවාඩු ප්‍රතිපූර්ණය කිරීම
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ යෝජනා ක්‍රමය
- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක වැටුප මෙන් 12% ක් සංස්ථාව මඟින් දායක වන අතර, සේවකයාගේ දායකත්වය 10% ක් වශයෙන් ගෙවනු ලැබේ.
- සේවක භාරකාර අරමුදල වෙනුවෙන් සංස්ථාව විසින් 3% ක දායකත්වයක් ලබා දෙනු ඇත.

පොදු උපදෙස් මාලාව :

- අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්, ලබාගත් පුහුණු, සේවා පළපුරුද්ද, දැනට දරන තනතුර, වැටුප් තලය හා පරිමාණය, පෙර දරූ තනතුරු, පූර්ව සේවා ආයතනවල බැඳුනු හා අස්වූ දිනයන්, සහතික වල පිටපත් සහිතව හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපින ඇතුළත් ජීව දත්ත විස්තර සහිත ඉල්ලුම්පත් මෙම දැන්වීමේ දින සිට දින 10 ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පතු බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව ලිවිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල ඉල්ලුම්කරුවන් සිය අයදුම්පත් සිය අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෛද්‍ය එස්.ජී. සමරසුන්දර,
සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,
අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,
කඳවල එස්ටේට්, රත්මලාන.